# පරිසරය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති

ඕනෑම සමාජ සංවිධානයකට පරිසරය අමතක කර එහි සංස්කෘතික, ආර්ථික හා සමාජීය සංවර්ධනය ලබා කරගත නොහැක. අතීතයේ නොයෙක් සමාජ හුදකලාව නැතහොත් තනිවම සිය කාර් යයන් ඉටු කර ගත් ආකාරයක් දැකිය හැකිය. එහෙත් මෙම සීමිත පරිසරය පසු කාලයේදී විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව තුළින් පුළුල් වන්නට විය. අනෙක් අතට පුළුල් වීමක් ලෙස නොව ලොව පරිසරය කුඩා වූවායයිද කිව හැක. තාක්ෂණයේ හා විද්‍යාවේ දියුණුව සමාජයික පරිසරය කෙරෙහි හානිදායි බලපෑම් ඇති කිරීමට ද හේතුවේ. එහි ප්‍රතිඵලයක් ලෙස පරිසර සංරක්ෂණය හා කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සැකසීමේ අවශ්‍යතාවය මතු වන්නට විය. ස්වභාවික පරිසරයේ (එයටම ආවේනික වූ) සමතුලිතතාවය හා චක්‍රීය ස්වාභාවය රැක ගැනීම සඳහා මිනිසාට ද විශාල වගකීමක් ඇති බව අවබෝධ වන්නට පටන් ගති.

## අතීත අත්දැකීම්

අතීතයේ ශ්‍රී ලංකාවේ රජවරු සිය රාජ්‍ය පාලනයේ දී, වැවත්, දාගැබත් පදනම කරගත් සංකල්පය මත ස්වකීය දේශපාලන, සමාජීය, ආර්ථික හා සංස් කෘතික ප්‍රතිපත්ති ගොඩ නංවා තිබුණි. පරිසරය දේවත්වයෙන් සලකන ලද අතර, පරිසරය සුරැකීම, සංරක්ෂණය කිරීම රජුගේ සෘජු කාර්ය භාරයක් බවද පැහැදිලිය. හෙළ රජ දරුවන් උයන් වතු, වැව්, කරවීම පිළිබඳව දේශාන්තර වශයෙන් ද කීර්තියක් හිමිකර ගෙන තිබුණි. බෞද්ධ දර්ශනය අනුව ද තමාගේ හිසට සෙවන දෙන ගසක අතු සිඳීම කළගුණ නො දත්තකුගේ ක්‍රියාවක් ලෙස සඳහන් වේ. ඇතැම් සෙල්ලිපි වල සතුන්ට හිංසා කිරීම දඬුවම ලැබිය යුතු අපරාධයක් ලෙස සඳහන් වෙයි. එමෙන්ම ජල කළමනාකරණය හා ඉඩම් පරිහරණයද පරිසර සංරක්ෂණ යෙහි ලා රටේ පාලකයා වූ රජුට පැවරුණු කාර්යය භාරය පුළුල් බව පැහැදිලි වෙයි. සියළුම ගම් රජය සතු විය. ඒවා තාවකෙකුට පැවරීමේ බලය රජතුමා සතුවිය.

එසේ වුවත් ලෝකයේ ඉතා දියුණු රටවල මෙන් පරිසර සංරක්ෂණයෙහි ලා බලවත් නීති පද්ධතියක් හෝ පරිසර අධිකාරියක් මෑත භාගය වන තෙක්ම අප සතු නොවීය. පරිසර සංරක්ෂණයෙහි ලා සෘජුව හා වක්‍රව පනවන ලද පනත් සියයකට අධික සංඛ්‍යා වක් අප සතුව තිබුණි. මෙම නීති රජය විසින් එලෙසම ක්‍රියාත්මක කළා ද නැතහොත් ඒවා පණත් වලට පමණක් සීමා වූවාද යන්න පැහැදිලි නැත. එය එසේ කුමණ හේතුවක් මත වී ද යන්න පැහැදිලි කිරීම අපහසුය.

## කළමණාකරණය

පරිසර ආරක්ෂා කිරීමෙහි හා කළමනා කරණය කිරීමෙහි අවශ්‍යතාවය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් වේ. රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ 27 වන ව්‍යවස්ථාවේ 14 වන උප ව්‍යවස්ථාවේ ''ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩිදියුණු කළ යුත්තේය.'' යනු වෙන්ද, 28 වන ව්‍යවස්ථාවේ (ඊ) උප ව්‍යවස්ථාවේ ''ස්වභාව ධර්මය සහ ස්වා භාවික සම්පත් රැකගැනීමද ශ්‍රී ලංකා වාසී හැම තැනැත්තකුගේම යුතු කම වන්නේය'' යනුවෙන්ද සඳහන් වී ඇත.

පරිසරය පිළිබඳ ප්‍රතිපත්ති සැකසීමේ උපදෙස් දීමේ හා ආයතන සම්බන්දී කරණය කිරීමේ මූලික ආයතනයක් නැති කමේ අඩුව සපුරාලමින් එවකට ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය දැරූ ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ යෝජනාවක් අනුව 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පණත යටතේ මධ්‍යම පරිසර අධිකාරිය පිහිටුවනු ලැබීය. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර සංරක්ෂණ යේ හා කළමනාකරණයේ ලා රාජ්‍ය, රාජ්‍ය නොවන හා අන්තර් ජාතික ආයතන අතර සම්බන්ධතාවය ගොඩ නැංවීම කරනු ලැබේ.

මෑත කාලයේ දී ශ්‍රී ලංකාවේ ඉතා විශාල වශයෙන් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති හේතු කොට ගෙන පරිසරය කෙරෙහි අනිටු බලපෑම් ඇති කරවන්නට විය. මෙහිදී පරිසරයේ ඇති ස්ථායීතාවය පවත්වාගෙන යාමේ වැදගත් කම ඉතාමත් පැහැදිලි විය. අනාගතයේ දී බිහිවන පරම්පරාවලට ද මිහිතලය රක්ෂා කොට දෙමින් වර්තමාන පරම්පරාවේ උවමනා වන් සපුරාගත යුතු බව තේරුම් ගෙන චිරස්ථායී සංවර්ධනයක් වෙනුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු විය.

## පොදු ප්‍රතිපත්ති

ඒ අනුව පරිසරය ආරක්ෂා කිරීමේ පොදු ප්‍රතිපත්ති රාමුවක් අවශ්‍ය විය. එවැන්නක් තුළ ජාතික සංරක්ෂණ උපාය මාර්ගයක් අඩංගු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කරන ලදී. ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා වූ අන්තර් ජාතික සංගමය විසින් සකස් කරන ලද ලෝක සංරක්ෂණ උපාය මාර්ගය සකස් කිරීමෙහිදී පුරෝගාමී වූ රටවල් අතරින් ශ්‍රී ලංකාව ද එකක් බව සඳහන් කිරීම වැදගත් ය. ජාතික සංරක්ෂණ උපාය මාර්ග අනුව සංවර්ධන ය හා සංරක්ෂණය අතර සමීප සම්බන්ධ තාවයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය අවධාරනය කරයි. එහෙයින් මෙම සංරක්ෂණ උපාය මාර්ගය ඉදිරිපත් කර ඇත්තේ පරිසර පාලනය හා කළමනා කරණය සඳහා විවිධ ක්ෂේත්‍ර අතර ඇති ඒකාබද්ධතාවය තවදුරටත් ශක්තිමත් කිරීමටය. සංවර්ධනයට තුඩු දෙන්නා වූ ස්වාභාවික සම්පත් ස්ථාවර පදනමකින් පවත්වා ගැනීමටත්, මානව කටයුතු වලට ඔරොත්තු දීමේ ශක්තියක් පරිසරය තුළ රඳා පවත්වා ගැනීමටත් තුඩු දෙන්නා වූ, උචිත ස්ථිරසාර පාරිසරික ප්‍රතිපත්තියක් භාවිතයට පත් කිරීමේ අරමුණත් ඒ තුළ ඇත. ඉඩම් පරිහරණය, වන බිම් රැක ගැනීම, වගුරු බිම් රැක ගැනීම, කර්මාන්ත ප්‍රතිපත්ති සැකසීම, සත්ත්ව පාලනය, පරිසර අධ්‍යාපනය, පාරිසරික බලපෑම් ඇගයීම, සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ එකඟත්වය, මහජන සහභාගීත්වය ආදී සෑම ක්ෂේත්‍රයක් ද එකී සංරක්ෂණය කිරීමේ උපාය මාර්ග තුළ අන්තර්ගතව ඇත.

1983 දී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 1984 සිට පරිසර බලපෑම් ඇගයීම ක්‍රියාත්මක කරනු ලැබිය. ඒ අනුව ඕනෑම සංවර්ධන ව්‍යා පෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ඒවායේ පාරිසරික බලපෑම් ඇගැයීමක් කර වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කරන ලදී. මෙහි අරමුණ වන්නේ යම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වීමේදී එයින් පරිසරයට වන හානිය

බලපෑම් හඳුනා ගැනීමත්, ඒවා වැලැක්වීමට පියවරගැනීම හෝ අවම කිරීම සඳහා සුදුසු පූර්ව උපක්‍රම යෙදීමෙන්ය. චිරස්ථායී සංවර්ධනයක් ඇති වන පරිදි පරිසර සම්පත් භාවිතා කරන අයුරු අධ්‍යයනය කිරීම පරිසර බලපෑම් ඇගයීම තුළින් කරනු ලැබේ.

1988 අංක 56 දරණ ජාතික පාරිසරික (සංශෝධන) පනත යටතේ මෙය නීතිමය අවශ්‍යතාවයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. රජයේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක්, සංගමයක් හෝ පුද්ගලයෙක් ලංකාව තුළ ආරම්භ කරනු ලබන ඕනෑම ව්‍යාපෘතියක් සඳහා පාරිසරික බලපෑම් ඇගැයීමේ වාර්තාවක් , ව්‍යාපෘතියක් අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතු වේ.

## තාක්ෂණ දියුණුව

විද්‍යාවේ හා තාක්ෂණයේ දියුණුව තුළින් ලබාගත් ජයග්‍රහණයන් නිසා පෘතුවියටත් මිනිසාටත්, දරාගත නොහැකි පාරිසරික දූෂණයක් සිදුවන බව පිළිගත යුතු සත්‍යය කි. කාර්මික සංවර්ධනය තුළින් ඇතිවන පාරිසරික දූෂණය අවම කිරීම සම්බන්ධයෙන් රජයේ අවධානය විශේෂයෙන් යොමු කරමින්, 1988 අංක 47 දරණ ජාතික පාරිසරික පණත සංශෝධනය කරමින් 1988 අංක 56 දරණ ජාතික පාරිසරික (සංශෝධිත) පනත යටතේ පරිසර සුරැකීම සඳහා නීතිමය බලය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිගන්නා ලදී. පරිසරයේ තත්ත්වය විධිමත්ව, පවත්වා ගෙන යාම සහ පාලනය කිරීම සඳහා පරිසර දූෂණය වැලැක්වීම, නතර කිරීම, පාලනය කිරීම සඳහා පෙර තිබුණාට වඩා නීතිමය බලය පුළුල් කිරීමෙන් රජය අදහස් කළේ සංවර්ධනය කෙටි කාලයක් නොව දිගුකල් රඳා පවත්වා ගැනීමටයි. ඒ අනුව මෙම පනත යටතේ පාරිසරික ආරක්ෂාව සඳහා පරිසර දූෂණය සිදුවිය හැකි අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම, පිට කිරීම හෝ එහි තැන්පත් කිරීම පාලනය සඳහා වන නීති 1990 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

සංවර්ධනය සිදුවිය යුත්තේ සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය තුළිනි. එහෙයින් ස්වභාවික සම්පත් කළමනාකරණය සංරක්ෂණය, ඉඩම් පරිහරණය, වන සම්පත් සුරැකීම, සෝද පාළුව වැලැක්වීම, වෙරළ සංරක්ෂණය, ජල දූෂණය වැලැක්වීම ආදී සෑම විෂයක් කෙරෙහිම අවධානය යොමු කරමින් රටේ ස්වභාවික සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම හා ඒවා අනාගත පරම්පරාවලට ආරක්ෂා කර තැබීම පිණිස මූලික ප්‍රතිපත්ති හා එම ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ද සංශෝධිත පනත යටතේ රජය විසින් මූලික අවධානය යොමු කර ඇත. එමෙන්ම පාරිසරික අධ්‍යාපනය හා පරිසර අවබෝධය පිළිබඳව දැඩි අවධානයක් දක්වා ඇත.

මධ්‍යම පරිසර අධිකාරියේ
අධ්‍යක්ෂ ජනරාල්

**කේ. ඒ. එච්. රණවීර
විසිනි.**

කෘෂි කර්මයෙන් පරිසරයට වන බලපෑම් ගැන ද රජයේ අවධානය යොමු වී ඇත. පළිබෝධ නාශක ආනයනය කිරීමේදී සුපරික්ෂාකාරී වීමට රජය පියවර ගෙන ඇත්තේ ඒවායෙන් සිදුවිය හැකි හානිකර තත්ත්වයන් සැලකිල්ලට ගැනීමෙන්ය. මේ සඳහා විශේෂ තත්ත්ව පරීක්ෂණ මාර්ගයක් ද සකස්කර ඇත.

## විශේෂ අවධානයක්

රජයේ සෑම ප්‍රතිපත්තියක්ම ක්‍රියාත්මක කිරීමේදී පරිසරය ගැන විශේෂ අවධානයක් යොමු කර ඇති බව ඉතා පැහැදිලිය. පරිසරය පිළිබඳව අමාත්‍යාංශයක් පිහිටුවීමෙන් පරිසරය සංරක්ෂණයෙහි රජයේ ඇති වැදගත්කම සනාථ කර ඇත. පරිසර සංරක්ෂණය සමඟ චිරස්ථායී සංවර්ධනයක් ඇති කිරීම, රජයේ ප්‍රතිපත්තිය වේ.



මෙබඳු සුන්දර පරිසරය: රැකීම සැමගේ යුතුකමයි.